# 6 වන ශ්‍රේණිය

# භූගෝල විද්‍යාව

## විෂය නිර්දේශය

**(2007 වර්ෂයේ සිට 6 වන ශ්‍රේණිය සඳහා)**

**සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව**

**ජාතික අධ්‍යාපන ආයතනය**

**මහරගම**

**ශ්‍රී ලංකා**

2006

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

# 1.0 හැඳින්වීම

සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයය සමෝධානිකව ඉගැන්වීම නිසා ඉතිහාසය, භූගෝල විද්‍යාව හා පුරවැසි අධ්‍යාපනය පිළිබඳ සිසුන්ගේ දැනුම කුසලතා හා ආකල්ප පහළ මට්ටමක පවතින බවත් සිසුන් ලබාගත් දැනුම ප්‍රායෝගික ව භාවිත නොවන බවත් විවිධ පර්යේෂණවලින් හා ප්‍රසිද්ධ විභාගවලදී සිසුන් දී ඇති පිළිතුරුවලින් අනාවරණය විය. ඒ සඳහා වහා ප්‍රතිකර්ම යෙදිය යුතු බවට සමාජයේ විවිධ කොටස්වලින් බලපෑම් එල්ල විය. එබැවින් 2005 වසරේ සිට සමාජ අධ්‍යයනය හා ඉතිහාසය යන විෂයය වෙනුවට භූගෝල විද්‍යාව, ඉතිහාසය, පුරවැසි අධ්‍යාපනය යනුවෙන් අනිවාර්යය විෂයයන් තුනක් 7 වන ශ්‍රේණියේ සිට ඉගැන්වීමට තීරණය කර ක්‍රියාත්මක කරන ලදි.

ශ්‍රී ලංකාවේ සියලුම විෂය මාලාවන් නවීකරණය විය යුතු බව හා නිපුණතා පාදක අධ්‍යාපනයක් සියලුම පාසල් දරුවන්ට ලබාදීම අත්‍යාවශ්‍ය නිසාත්, 2007 වසරේ සිට භූගෝල විද්‍යාව විෂයය 6 වන ශ්‍රේණියේ සිටම පාසල් පද්ධතියට හඳුන්වාදීමට කටයුතු යොදා ඇත. තවද, 2007 වසරේ සිට 10 වන ශ්‍රේණියට ද භූගෝල විද්‍යාව නව විෂයය නිර්දේශය හඳුන්වා දෙනු ලැබේ.

භූගෝල විද්‍යා විෂයයෙන් ස්ථානීය, ප්‍රාදේශීය හා ගෝලීය පරිමාණයන්ගෙන් ස්වභාවධර්මය හා සමාජය අතර අන්තර් සම්බන්ධතාවය හා ඒවායේ රටාවලින් හා ක්‍රියාවලීන් අවකාශීය කාලික යථාදර්ශයකින් අධ්‍යයනය කිරීම සිදු වේ. එමෙන්ම භූගෝල විද්‍යාව විෂයමාලාව අධ්‍යයනයෙන් ශිෂ්‍යයින්ට තමා ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගැනීමට හැකිවන අතරම, එකිනෙකා සමගත් පරිසරය සමගත්, සුසංයෝගිව ජීවත්වීමේ වැදගත්කම පිළිබඳව අවබෝධයක් ලබාගෙන ක්‍රියාත්මක විය හැකි ය.

ඒ අනුව, 6 වන ශ්‍රේණියේ විෂයය නිර්දේශය අධ්‍යයනයෙන් ශ්‍රී ලංකාවේ පිහිටීම , තම නිවස හා ආසන්න වට පිටාවේ භූගෝලීය ලක්ෂණ හඳුනා ගැනීමටත් , නිවස අවට වටපිටාව යහපත්ව පවත්වා ගැනීමටත් හැකියාව ලැබෙනු ඇත. මෙම විෂයය නිර්දේශය පන්ති කාමර මට්ටමින් ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ දී 50% වැඩි ප්‍රමාණයක් ප්‍රායෝගික ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කිරීම අපේක්ෂිතය. එමගින් සිසුන්ගේ දැනුම, ආකල්ප, කුසලතා සමබර වන ආකාරයේ ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමට හැකිවනු ඇත. එය ශිෂ්‍යයා තුළ නිපුණතා සංවර්ධනය කිරීමට පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## නිර්වචනය

භූගෝල විද්‍යාව යනු ස්ථානීය, ප්‍රාදේශීය හා ගෝලීය පරිමාණයන්ගෙන් ස්වභාවධර්මය හා සමාජය අතර ඇති අන්තර් සම්බන්ධතා සහ ඒවායේ රටාවලින් හා ක්‍රියාවලීන් අවකාශීය හා කාලික යථාදර්ශයකින් අධ්‍යයනය කිරීමයි.

## අරමුණ

මෙම විෂයය මාලාව ශිෂ්‍යයින්ට ජීවත්වන ලෝකයේ විවිධත්වය තේරුම් ගැනීමට උපකාරවන අතර ම එකිනෙකා සමගත් පරිසරය සමගත් සුසංයෝගී ව ජීවත්වීමේ වැදගත්කම පිළිබඳ අදහසක් ද දනවයි.

## 2.0 භූගෝල විද්‍යා විෂයයේ ප්‍රධාන නිපුණතා

1.0 තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලීන් පරික්ෂා කිරීමට උගනියි.

2.0 භෞතික මානව භූ දර්ශනයේ සංරචක, ගති ලක්ෂණ හා ක්‍රියාවලීන් පිළිබඳව උගනියි.

3.0 භෞතික හා මානුෂ ක්‍රියාවලීන්ගේ අන්තර් ක්‍රියා , භෞතික හා මානව පරිසරය කෙරෙහි බලපාන ආකාරය පරික්ෂා කරයි.

4.0 භෞතික හා මානුෂ භූ දර්ශන තේරුම් ගැනීමට උපකාරී වන භෞතික හා මානුෂ භූගෝල විද්‍යාවේ මූලික සංකල්ප සහ ක්‍රමවේද උගනියි.

5.0 භෞතික සහ මානුෂ භූ දර්ශන තේරුම් ගැනීම, විශ්ලේෂණය හා අර්ථකථනය කිරීම සඳහා සාකල්‍ය ප්‍රවේශය යොදා ගනියි.

6.0 භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරී වන ධනාත්මක ආකල්ප වර්ධනය කරගනියි.

7.0 දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට , අර්ථ නිරූපණය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි.

8.0 ජීවිතයේ අභියෝගාත්මක අවස්ථා ජය ගැනීමට උපකාරී වන සුවිශේෂී දිවි රැකුම් කුසලතා භාවිත කරයි.

9.0 ස්වභාවධර්මය හා සමාජය අතර සුසංයෝගී අන්තර් සම්බන්ධතාව ප්‍රවර්ධනය කිරීම සඳහා පෘථිවිය හා එහි වැසියන් පිළිබඳ මනා අවධානයකින් සිටීමේ වැදගත්කම වටහා ගනියි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

### 2.1 6 වනශ්‍රේණියට අදාළ නිපුණතා මට්ටම

- තම නිවස සහ ආසන්න වටපිටාව අතර ඇති අන්තර් සම්බන්ධතාවේ ස්වභාවය අධ්‍යයනය කරයි.
- තම නිවස සහ වටපිටාව යහපත්ව පවත්වා ගැනීමට දායකවෙයි.
- ශ්‍රී ලංකාවේ පිහිටීම හඳුනා ගනියි.
- ශ්‍රී ලංකාව ලෝකයේ වෙනත් දූපත් සමග සැසඳීමට උගනියි.
- තම සම්පස්ථ වටපිටාවේ භූගෝලීය ලක්ෂණ හඳුනා ගනියි.

## 2.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු වඩා සාර්ථක ඉගෙනුම් අත්දැකීම් බවට පත් කිරීම සඳහා සෑම ශිෂ්‍යයෙකුට ම සහභාගී විය හැකි වැඩ සටහන් සම්පාදනය කිරීම පාසල් පාලන අධිකාරීන්ගේ වගකීමක් කොට සැලකේ. පහත දැක්වෙන්නේ එවැනි විෂය සමගාමී ක්‍රියාකාරකම් කිහිපයකි.

- භූගෝල විද්‍යා විෂය සංගමයක් පිහිටුවීම : මෙ මගින් දැනුම මිනුම වැඩ සටහන්, විවාද, ප්‍රදර්ශන, බිත්ති පුවත්පත් හා වාර ප්‍රකාශන වැනි විවිධ කාර්යයන් සඳහා සිසුන් යොමු කිරීම.
- බිහි වැඩ, ක්ෂේත්‍ර චාරිකා හා අධ්‍යාපන චාරිකා සංවිධානය කිරීම.

- පුද්ගලයින් හා පොත පත මූලාශ්‍ර වශයෙන් ගෙන කුඩා පරිමාණයේ පර්යේෂණ ව්‍යාපෘති ආරම්භ කිරීම : මෙ මගින් විවිධ වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීමට පෙළඹවීම.

- ප්‍රදේශයේ පිහිටුවා ගෙන තිබෙන වෙනත් පාරිසරික සංවිධාන සමග එක්ව කටයුතු කිරීමට සිසුන් දිරි ගැන්වීමටත් භූගෝල විද්‍යාත්මක දැනුම පුළුල් කිරීමටත් උපකාර කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4 .0 ඉගැන්වීමේ ක්‍රමවේද හා කාලච්ඡේද

භූගෝල විද්‍යාව විෂය ගතික, සජීවී හා ප්‍රායෝගික විෂයකි. එසේ වුවද පසුගිය දශක කීපයක් තිස්සේ පාසල් පද්ධතියේ පන්ති කාමරයේ භාවිත කළ හුරු පුරුදු දේශන ක්‍රමය තව දුරටත් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ ප්‍රධාන උපාය මාර්ගයක් වශයෙන් පවත්වා ගැනීම මෙහි දී අවධාරණය නොකෙරේ. සිසුන් නිරන්තර ක්‍රියාකාරී පුද්ගලයන් බවට පත් කරවන, ඔවුන්ගේ ආකල්ප සුභවාදී ව වර්ධනය කරවන, තරගය වෙනුවට සාමූහිකත්වයට හුරු කරවන ආකාරයේ වඩාත් ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් නිපුණත්වයක් ඇති කර ගැනීම අවශ්‍යය. මේ සඳහා පන්ති කාමරය තුළ ගොඩ නඟා ගැනීමට හැකි ඉගෙනුම් ක්‍රමවේද , විද්‍යාව හා තාක්ෂණයේ වෙනස්කම් ද සමාජයේ අවශ්‍යතා ද සලකා සංවිධානය කර ගත යුතුය. ඒ වැනි ක්‍රමවේද කිහිපයක් පහත දැක්වේ.

### 4.1 බිහි වැඩ/ක්ෂේත්‍ර වැඩ

භූගෝල විද්‍යාවේ බොහෝ සංකල්ප පහසුවෙන් සාධනය කර ගත හැක්කේ ක්ෂේත්‍රයේ කෙරෙන බිහි වැඩ හෙවත් ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මගිනි. වඩා සංවිධානාත්මක ව හා පූර්ව සූදානමකින් යුතු ව , ඉවසිලිමත් ව හා සාමූහික ව සිදු කරන බිහි වැඩ මගින් වඩා යහපත් ප්‍රතිඵල ලබා ගත හැකිය. මෙවැනි ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් සංවිධානය කළ හැකි අවස්ථා කීපයකි.

#### (අ) ආසන්න පරිසරය යොදා ගැනීම

ශිෂ්‍යයාගේ ආසන්න පරිසරය පාදක කොට බිහි වැඩ ක්‍රියාත්මක කිරීමෙන් නිරීක්ෂණය, ගවේෂණය හා දත්ත රැස් කිරීම වැනි ඉගෙනුම් ක්‍රම පහසුවෙන් භාවිත කළ හැකිය. පාසලෙන් හෝ තම නිවසින් වඩා ඈතට නො ගොස් ආසන්න පරිසරය තේරුම් ගැනීමට ද, ආසන්න පරිසරයේ සිදු වන විවිධ ක්‍රියාකාරකම් පිළිබඳ ඍජු අත්දැකීම් ලබා ගැනීමට ද මෙ මගින් සිසුනට අවකාශ සැලසේ.

#### (ආ) පරිසරය සිතියම් ගත කිරීම

භූගෝල විද්‍යාවට අයත් මූලික සංකල්ප පහසුවෙන් සාධනය කළ හැක්කේ පරිසරයේ භූ විෂමතා ලක්ෂණ සිතියම් ගත කිරීමෙනි. එමගින් ප්‍රායෝගික භූගෝල විද්‍යාව පිළිබඳව පවතින ශිෂ්‍ය කුසලතා තව දුරටත් වර්ධනය කළ හැකිය. සිතියම් ගත කිරීමේ දී දිශාව, පරිමාණය හා සංකේත පිළිබඳ අවබෝධයක් ලබා දීම මේ මගින් අපේක්ෂා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.2 අධ්‍යාපන චාරිකා

පූර්ව සූදානමක් සහිතව, අරමුණු පැහැදිලිව හඳුනා ගෙන සුදුසු සංවිධානයක් සිසුන් අතරින් ම ගොඩ නගා ගැනීමෙන් විෂය නිර්දේශයේ අදාළ මාතෘකා කිහිපයකට අවශ්‍ය දැනුම හා අවබෝධය පහසුවෙන් ලබා දීමට අධ්‍යාපන චාරිකා ප්‍රයෝජනවත්ය. ඒ තුළින් මූලික සංකල්ප ද පහසුවෙන් අවබෝධ කළ හැකි වේ.

## 4.2 වාර්තා සැකසීම

විවිධ මාධ්‍ය උපයෝගී කර ගෙන ක්ෂේත්‍රයෙන් රුස්කර ගන්නා දත්ත පාදක කොට වාර්තා සැකසීමත් ඒවා පන්ති කාමරයේ දී ප්‍රගුණ කිරීම හා සාකච්ඡා කිරීමත්, තවත් ආකාරයක ඉගෙනුම් ක්‍රමවේදයකි. මෙම කාර්ය කණ්ඩායම් ක්‍රමයට ඉටු කිරීමට සිසුන් පෙළඹ වීමෙන් කණ්ඩායම් හැඟීම ඇති කිරීම මගින් යහපත් ප්‍රතිඵල ලැබිය හැකිය.

## 4.4 බිත්ති පුවත් පත්

බිත්ති පුවත් පත් මගින් ප්‍රකාශයට පත් කර විය හැකි තොරතුරු රාශියක් ඇත. ඉන් කිහිපයක් නම්

- බිහි වැඩ හා අධ්‍යාපන චාරිකා මගින් රුස්කර ගන්නා විවිධ තොරතුරු හා දත්ත
- අවට පරිසරය පිළිබඳ විවිධ වාර්තා
- දේශීය, කලාපීය හා ගෝලීය වශයෙන් සිදු වන භූගෝල විද්‍යාත්මක වටිනාකමකින් යුක්ත තොරතුරු, වාර්තා, චිත්‍ර හා ඡායාරූප
- සිසු නිර්මාණ

බිත්ති පුවත් පත් සැකසීම කණ්ඩායම් ක්‍රියාකාරකමකි. එමගින් දියුණු කළ හැකි කුසලතා හා ආකල්ප රාශියක් ඇත.

## 4. 5 ප්‍රදර්ශන

පාසල මගින් ප්‍රදර්ශන සංවිධානය ද ඉගෙනුම් ක්‍රම වේදයකි. මෙවැනි ප්‍රදර්ශනයකට ඇතුළත් කළ හැකි උපාංග රාශියකි. එනම්,

- ක්ෂේත්‍රයෙන් සොයා ගන්නා ලද භූගෝල විද්‍යාත්මක වටිනාකමකින් යුක්ත ද්‍රව්‍ය (විවිධ ප්‍රාණීන්, පැළෑටි වර්ග, පාෂාණ කැබලි ආදී වශයෙන්)
- කාලගුණික දත්ත රුස් කිරීමට භාවිත කරන විවිධ සිතියම්, ආකෘති හා බිත්ති පුවත්පත්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## 4.6 ක්ෂේත්‍ර පොත නිර්මාණය හා භාවිතය

පාසල ආසන්න පරිසරයේ හා ශ්‍රී ලංකාව තුළ සිදුවන භූගෝලීය වැදගත්කමක් ඇති විවිධ සිදුවීම් පිළිබඳ පින්තූර හා තොරතුරු එක්රැස් කිරීමට යොමු කිරීම ඉතා යෝග්‍යය. මෙසේ රැස් කර ගත් තොරතුරු සිසුවාගේ දැනුම වර්ධනයට හා නිර්මාණශීලී බව ඇති කිරීමට උපකාරී වේ.

පන්ති කාමරය තුළ සිදු කෙරෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ඉහත දැක් වූ ඉගෙනුම් ක්‍රමවේද සංශෝධන සහිතව හා අවස්ථාවෝචිත ව යොදා ගැනීමට ගුරුවරුන්ට හැකියාවක් ඇත.

<u>යෝජිත කලාච්ඡේද</u>

| 6 ශ්‍රේණිය | විෂයය ඒකක | | කාලච්ඡේද |
|---|---|---|---|
| | 6.1 | | 25 |
| | 6.2 | | 10 |
| | 6.3 | | 07 |
| | 6.4 | | 08 |
| | 6.5 | | 10 |
| | | එකතුව | 60 |

## 5.0 තක්සේරු කිරීම ඇගයීම

භූගෝල විද්‍යාවේ මූලික සංකල්ප පිළිබඳ අවබෝධයක් ශිෂ්‍යයින්ට ලබාදීමත් , ඒවා තම ක්‍රියාකාරකම් වලදී ව්‍යවහාර කිරීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීමත්, මෙම විෂය නිර්දේශයෙන් යෝජනා කෙරේ. ශිෂ්‍ය නිපුණතා ප්‍රවර්ධනය කිරීමේ දී කේවල සහ කණ්ඩායම් ක්‍රියාකාරකම් ක්‍රම භාවිත කිරීම නිර්දේශිතය. එවැනි ක්‍රියාකාරකම් පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලියට ඇතුලත් කළ හැකිය. එසේම කලාප සහ පළාත් මට්ටමින් පැවැත්වෙන වාර අවසාන හා වර්ෂ අවසාන ලිඛිත පරීක්ෂණ වලට ශිෂ්‍යයින් යොමු කිරීමට ද යෝජනා කෙරේ.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## නිපුණතාව

තමා ජීවත්වන පරිසරයේ ස්වභාවය හා ක්‍රියාවලීන් පරීක්ෂා කරයි.

## නිපුණතා මට්ටම

තම නිවස සහ ආසන්න වටපිටාවේ අන්තර් සම්බන්ධතාවේ ස්වභාවය අධ්‍යයනය කරයි.

## අන්තර්ගතය

6.1 තම නිවස සහ ආසන්න වටපිටාවේ අන්තර් සම්බන්ධතාව කාලච්ඡේද 25

6.1.1 නිවස

- පිහිටීම
- ඉඩමේ හැඩය
- නිවසේ සිට විශේෂිත ස්ථානවලට ඇති දිශාව
- නිවසේ සිට විශේෂිත ස්ථානවලට ඇති ආසන්න දුර

6.1.2 ආසන්න වටපිටාව

6.1.2.1 භූ විෂමතාව

- උස්බිම්
- බෑවුම්
- තැනිතලා
- ගංගා සහ ඇළ දොළ
- වෙරළ තීරය.

6.1.2.2 කාලගුණය

- උෂ්ණත්වය
- වර්ෂාපතනය
- සුළං
- වලාකුළු
- දෘශ්‍යතාව

6.1.2.3 ශාක හා සත්වයින්

- ශාක වර්ග
- සත්ව වර්ග

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

6.1.2.4 මානුෂ ක්‍රියාකාරකම්

- කෘෂිකර්මය
- කර්මාන්ත
- සේවා

# යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්

## තම නිවස සහ ආසන්න වටපිටාවේ අන්තර් සම්බන්ධතාව

- නිවසේ දිග පළල

  නිවසේ සිට ළිඳට දුර

  වැසිකිළියට දුර

  වැවට දුර

  විශේෂිත ස්ථානවලට ඇති දුර
- මැනිම හා වාර්තා තබා ගැනීමට සිසුන් යොමු කිරීම.
- නිවස හා එය පිහිටා ඇති ඉඩමේ දළ සැලැස්මක් ඇඳීම හා ඒවා නම් කිරීම.

ආසන්න වටපිටාව

මැටි වැනි ද්‍රව්‍යයක් තෝරාගෙන ආසන්න පරිසරයේ ඇති උස්බිම්, බෑවුම්, තැනිතලා, ගංගා, ඇළ දොළ, වෙරළ වැනි ලක්ෂණ නිරූපණය වනසේ ආකෘතියක් නිර්මාණය කිරීම.

- සකස් කළ නිර්මාණයේ එක් එක් භූ ලක්ෂණ නම් කිරීම. (කොළ කැබලිවල ලියා ඇල්පෙනෙති යොදාගෙන සවි කිරීම).

කාලගුණය

- උෂ්ණත්වමාන උපයෝගී කරගෙන පාසල් කාලය තුළ අවස්ථා කිහිපයකදී උෂ්ණත්වය මැනිම හා වාර්තා තබා ගැනිම (පාසල ආරම්භයේ දී , අදාළ කාලච්ඡේදයේ දී හා දිවා විවේකයේ දී)
- ආදර්ශ වර්ෂා මාන සකස් කිරීමේ ක්‍රියාකාරකමක යෙදවීම.
- සුළං දිශා දර්ශක සකස් කිරීම හා සුළං දිශාව වෙනස්වන ආකාරය නිරීක්ෂණය කර වාර්තා තබා ගැනිම.
- කළු කඩදාසියක පුළුන් වැනි දෙයක් යොදා ගෙන කෙඳි වලාකුළු කැටි වලාකුළු ස්ථර වලාකුළු නිර්මාණය කිරීම හා වැහි වලාකුළුවල ස්වරූපය නිර්මාණය කිරීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

ශාක හා සත්ත්වයින්

- ආසන්න පරිසරයේ ඇති ශාක වර්ග පිළිබඳ ලේඛනයක් සකස් කිරීම.
- ඖෂධ , දැව ආහාර, පරිසර අලංකරණය ආදි කාණ්ඩවලට සපයා ගත් ලේඛනයේ ශාක වර්ග වෙන් කිරීම.
- තම ගෙවත්තේ හා ආසන්න පරිසරයේ දක්නට ලැබෙන සතුන් වර්ග

| උරග | කෘමි | සිව්පා | පක්ෂි | මත්ස්‍ය |
|---|---|---|---|---|
| | | | | |

## මානුෂ ක්‍රියාකාරකම්

- තම ආසන්න පරිසරයේ කෘෂි කර්මය යටතේ වගා කරන භෝග වර්ග ලේඛනයක් සකස් කිරීම.
- නිවස හා ආසන්න පරිසරයේ ඇති කර්මාන්තයක් නරඹා යොදා ගෙන ඇති අමුද්‍රව්‍ය , නිෂ්පාදනය, බෙදා හැරීම පිළිබඳ තොරතුරු පත්‍රිකාවක් සකස් කිරීම (ක්ෂේත්‍ර චාරිකාවක් මගින්)
- ආසන්න පරිසරයේ සේවා පිළිබඳ පහත සඳහන් මාතෘකා යටතේ තොරතුරු රැස් කිරීම.

1. ප්‍රවාහනය
2. සන්නිවේදනය
3. අධ්‍යාපනය
4. බැංකු
5. රක්ෂණ
6. සංචාරක ස්ථාන
7. සෞඛ්‍යය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ගුණාත්මක යෙදවුම්

- ශ්‍රී ලංකා ජාතික සිතියම් පොත
- තම පාසල අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාස සිතියම
- භූ ලක්ෂණ දැක්වෙන පින්තූර
- අධ්‍යාපනික වැඩ සටහන්
- පොත්, පුවත්පත් හා සඟරා
- අදාල ඩිස්කවරි වැඩසටහන් හා අනෙකුත් පාරිසරික වැඩසටහන්
- පාට පැන්සල්
- අඳින කඩදාසි
- සටහන් පොත

## නිපුණතාව

භෞතික හා මානුෂ භූ දර්ශනය සංරක්ෂණය කිරීමට හා පවත්වා ගැනීමට උපකාරිවන ධනාත්මක ආකල්ප වර්ධනය කර ගනී.

## නිපුණතා මට්ටම

තම නිවස සහ වටපිටාවේ යහපත්ව පවත්වා ගැනීමට දායක වෙයි.

## අන්තර්ගතය

6.2 තම නිවස අවට වටපිටාව යහපත්ව පවත්වා ගැනීම කාලච්ඡේද 10

6.2.1 සම්පත් උපයෝජනය සහ සංරක්ෂණය

- භූමිය
- ජලය
- වාතය
- බලශක්තිය

6.2.2 අපද්‍රව්‍ය බැහැර කිරීම.

- ගෘහස්ථ අපද්‍රව්‍ය
- කෘෂිකාර්මික අපද්‍රව්‍ය
- කාර්මික අපද්‍රව්‍ය

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්

- ආදර්ශ ගෙවත්තක් සකස් කිරීම.
  (වැට, පළතුරු පැළ, එළවළු, පලාවර්ග, ධාන්‍ය වර්ග,අල වර්ග , භූමියේ සෝදා පාලුව වැළැක්වීම, ආදිය ඇතුළත්ව)
- ජලය ප්‍රයෝජනයට ගැනීම හා සංරක්ෂණය පිළිබඳ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග ඇතුළත් ආදර්ශ පාඨ සකස්කිරීම.
- නිවසේ ඉන්ධන අරපිරිමැස්ම (පෙට්‍රල් , ඩීසල් , දර, භූමිතෙල්,) විදුලිය අරපිරිමැස්ම, ඇතුළත් වන සේ නාට්‍යක් සකස් කර රඟ දැක්වීම.
- අපද්‍රව්‍ය යොදා ගෙන පොහොර සකස් කිරීමේ විවිධ ක්‍රම ක්‍රියාත්මක කිරීම.

## ගුණාත්මක යෙදවුම්

- ජාතික සිතියම් පොත
- අධ්‍යාපන වැඩ සටහන්
- අදාළ ඩිස්කවරි වැඩසටහන් හා අනෙකුත් පාරිසරික වැඩසටහන්
- පුවත් පත්, සඟරා, හා අත්පත්‍රිකා
- පාට පැන්සල්
- අඳින කඩදාසි
- සටහන් පොත

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## නිපුණතාව

භෞතික හා මානව භූදර්ශනයේ සංරචක , ගති ලක්ෂණ හා ක්‍රියාවලීන් පිළිබඳව උගනීයි.

## නිපුණතා මට්ටම

ශ්‍රී ලංකාවේ පිහිටීම හඳුනා ගනියි.

## අන්තර්ගතය

6.3 ශ්‍රී ලංකාවේ පිහිටීම කාලච්ඡේද 07

- ඉන්දියන් සාගරයේ අනිකුත් රටවලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ පිහිටීම.
- ලෝක සිතියමක අක්ෂාංශ හා දේශාංශ අනුව ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම.
- ශ්‍රී ලංකාව දූපතක් වශයෙන් පිහිටීම.

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්

- ආදර්ශ ලෝක ගෝලය හා ලෝක සිතියම් භාවිත කරමින් ශ්‍රී ලංකාව වටා පිහිටි රටවල් හා ඒවා පිහිටා ඇති දිශාව දැක්වීමේ කණ්ඩායම් ක්‍රියාකාරකමක යෙදවීම.
- ප්‍රධාන අක්ෂාංශ හා දේශාංශ රේඛා කිහිපයක විහිදීම ලෝක සිතියමක තිත් සටහන් කර දී ඒ අනුව නූල් ඇඳ අක්ෂාංශ හා දේශාංශ නම් කරවීම හෝ බෝලයක අක්ශාංශ හා දේෂාංශ දැක්වෙන දළ සටහනක් ඇන්දවීම.
- ශ්‍රී ලංකාවට උතුරින් දකුණින් ඇති අක්ෂාංශත්, නැගෙනහිරින් හා බටහිරින් ඇති දේශාංශත් නම් කර නිරපේක්ෂ පිහිටීම ලිවීම.
- ඇට්ලස් පොත්, ආදර්ශ ගෝලය ආදිය උදව් කරගෙන ශ්‍රී ලංකාවේ පිහිටීම පිළිබඳ වැදගත් කරුණු වාර්තා කිරීම.
- ඉන්දියන් සාගරය තුළ ශ්‍රී ලංකාවේ පිහිටීම සිතියමකින් දැක්වීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## ගුණාත්මක යෙදවුම්

- ආදර්ශ ලෝක ගෝලය
- ලෝක සිතියම්
- ජාතික සිතියම් පොත
- අධ්‍යාපන වැඩ සටහන්
- අදාළ ඩිස්කවරි වැඩසටහන් හා අනෙකුත් පාරිසරික වැඩසටහන්
- පාට පැන්සල්
- අඳින කඩදාසි
- සටහන් පොත

## නිපුණතාව

භෞතික හා මානව භූදර්ශනයේ සංරචක , ගති ලක්ෂණ හා ක්‍රියාවලීන් පිළිබඳව උගනී‍යි.

## නිපුණතා මට්ටම

ශ්‍රී ලංකාව ලෝකයේ වෙනත් දූපත් සමඟ සැසඳීමට උගනියි.

## අන්තර්ගතය

6.4 ශ්‍රී ලංකාව ලෝකයේ වෙනත් දූපත් සමඟ සසඳයි. කාලච්ඡේද 08

තෝරාගත් දූපත් කිපයක පිහිටීම සහ විශාලත්වය සසඳයි.

- බ්‍රිතාන්‍ය දූපත්
- කියුබාව
- ජපානය
- ෆීජ්
- මැඩගස්කරය
- සීෂෙල්ස්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්

- ලෝක සිතියම භාවිත කරමින් ලෝකයේ දූපත්වල නම් ලිවීම.
- ලෝකයේ දූපත් වලින් විශාලම දූපත් හා කුඩා දූපත් ලෙස කාණ්ඩ කිරීම.
- එක් එක් දූපත් පිහිටා ඇති සාගර හා ආසන්න රටවල් ලිවීම.

## ගුණාත්මක යෙදවුම්

- ආදර්ශ ලෝක ගෝලය
- ලෝක සිතියම්
- ජාතික සිතියම් පොත
- අධ්‍යාපන වැඩ සටහන්
- අදාළ ඩිස්කවරි වැඩසටහන් හා අනෙකුත් පාරිසරික වැඩසටහන්
- පාට පැන්සල්
- අඳින කඩදාසි
- සටහන් පොත

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.

## නිපුණතාව

දත්ත හා තොරතුරු විශ්ලේෂණය කිරීමට, අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සඳහා භූගෝල විද්‍යාවේ ක්‍රම ශිල්ප භාවිත කරයි.

## නිපුණතා මට්ටම

තම සම්පස්ථ වටපිටාවේ භූගෝලීය ලක්ෂණ හඳුනා ගනියි.

## අන්තර්ගතය

6.5 ආසන්න වටපිටාවේ භූගෝලීය ලක්ෂණ සිතියම් ගතකිරීමකාලච්ඡේද10

- ගංගා ඇල, දොළ
- ගොඩනැගිලි
- මාර්ග
- මංසන්ධි
- වෙනත්

## යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම්

- නිවස ආසන්න වටපිටාව දැක්වෙන දළ සිතියමක් ඇඳීම.

## ගුණාත්මක යෙදවුම්

- ශ්‍රී ලංකා ජාතික සිතියම් පොත
- තම පාසල අයත් ග්‍රාම නිලධාරි කොට්ඨාස සිතියම
- භූ ලක්ෂණ දැක්වෙන පින්තූර
- අධ්‍යාපනික වැඩ සටහන්
- පොත්, පුවත්පත් හා සඟරා
- අදාළ ඩිස්කවරි වැඩසටහන් හා අනෙකුත් පාරිසරික වැඩසටහන්
- පාට පැන්සල්
- අඳින කඩදාසි
- සටහන් පොත

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved.